කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව
අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය 111 කොටස- 2019/2020

පළමු සෙමෙස්තරය

# SC 408 - පාසල් උපදේශනය

කාලය පැය 03 යි

---

<u>පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න</u>

(1) i. උපදේශනය හා මාර්ගෝපදේශනය අතර වෙනස දක්වන්න.

ii. "පාසෝනියන් ආකෘතිය" යනු කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. "විභාග භීතිකාව" යනු කුමක්ද ?

iv. ජෝෂප් වෝල්ගේ ට අනුව දුස්සමාහිත චර්යාවක් ඇතිවන ආකාරය උදාහරණයක් ඇසුරින් ලියන්න.

v. පාසල් උපදේශකවරයකු සතුව තිබිය යුතු පෞරුෂ ගුණාංග 4 ක් ලියන්න.

vi. ගින්ස්බර්ග් ගේ වෘත්තීය උපදේශන න්‍යායට අනුව මනඃකල්පිත වෘත්තීය තේරීම් අවධිය කෙටියෙන් හඳුන්වන්න.

vii. කෝන්දේසි විරහිත ධනාත්මක සැලකිල්ල යනු කුමක්ද?

viii. උපදේශන සැසියකදී ප්‍රශ්නකරණය සිදුකළ හැකි මූලික ආකාර දෙක උදාහරණ දෙකක් ඇසුරින් දක්වන්න.

ix. පාසල් උපදේශන මධ්‍යස්ථානයක් භෞතික වශයෙන් පිහිටුවා ගැනීමේදී සැලකිලිමත් වියයුතු කරුණු 2 ක් ලියන්න.

x. "ලුහුඬුකරණය" යන්න අර්ථ දක්වන්න.

(ලකුණු 2x10 = 20)

(2) i. උපදේශනය යන්න අර්ථ දක්වා උපදේශනය සහ උපදෙස් දීම අතර වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ උපදේශන සේවා ඉතිහාසය කෙටියෙන් දක්වා පාසල් උපදේශන සේවාවේ අවශ්‍යතාවයෙහි වැදගත්කම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(3) i. උපදේශනයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍ර නම් කර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. උපදේශකයකු පිළිපැදිය යුතු පොදු ආචාර ධර්ම හතරක් (04) ක් කෙටියෙන් පැහැදිලි කර එම ආචාරධර්ම පාසල් උපදේශන සේවාවට ප්‍රායෝගික කළ යුතු ආකාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(4) i. ඔබ දන්නා උපදේශන න්‍යායකට අනුව ශිෂ්‍ය සේවාලාභියකු තුළ ගැටලුවක් ඇතිවන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. මොරිල්, ඔට්න් සහා හර්ස්ට් ගේ උපදේශන ආකෘතිය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(5) i. ශිෂ්‍ය සේවාලාභියකුගේ ගැටලුවක් හඳුනාගැනීම සඳහා තොරතුරු රස් කිරීමට යොදාගත හැකි පරීක්ෂණ නොවන වර්ගයේ ක්‍රම හතරක් (04) ක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. පාසල් උපදේශන සේවා මධ්‍යස්ථානයක ශිෂ්‍ය සේවාලාභීන්ගේ තොරතුරු විධිමත් ලෙස පවත්වා ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(6) i. උපදේශනයේදී භාවිත "ප්‍රාරම්භක කුසලතා" නම් කර, ඒවා වෘත්තිමය ගුරුවරයකුට ශිෂ්‍ය ගැටලු හඳුනාගැනීම සඳහා භාවිත කළ හැකි ආකාර උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. සිසුන් මුහුණ දෙන වෘත්තීමය ගැටලු නිරාකරණය සඳහා ඔබ උගත් වෘත්තීය මාර්ගපෙදේශන න්‍යායයන් යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(7) i. "සහකම්පනය" යනු කුමක්ද ? අර්ථ දක්වා එහි ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ගුරුවරයා උපදේශකවරයා යන භූමිකාවෙහි කටයුතු කිරීමේදී (Teacher as a counsellor) ශිෂ්‍ය ගැටලු හඳුනාගැනීමට හා නිරාකරණයට සහකම්පනික ප්‍රතිචාර දැක්විය හැකි ආකාර උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 10)

-----------